සමගි ජන බලවේගය
ஐக்கிய மக்கள் சக்தி | SAMAGI JANA BALAWEGAYA

2025.08.24

**මාධ්‍ය නිවේදනය.**

**<u>හිටපු ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අත්අඩංගුවට ගැනීම බලවත් පිළිකුලෙන් යුතුව හෙලා දකිමු.</u>**

රනිල් වික්‍රමසිංහ මැතිතුමා අත්අඩංගුවට ගැනීම සැලසුම් සහගත දේශපාලන කුමන්ත්‍රණයක් බව පැහැදිලි වේ.එය වඩාත් තහවුරු වන්නේ ආණ්ඩුවට හිතවාදී සමාජ මාධ්‍ය ජාලාවක ඉදිරිපත් කරන්නෙක් විසින් මෙම ක්‍රියාවලිය ජනගත කිරීම තුලයි.

එය නීතියේ ආධිපත්‍යයට එල්ල කළ අභියෝගයකි. ඒ පිළිබඳව ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ගය නොපමාව හෙළි කළ යුතුය.

මෙහි වඩාත් භයානක තත්ත්වය වන්නේ මෙම සිදුවීම තුළ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට බහු පක්ෂ ක්‍රමයට එල්ල වන තර්ජනයයි. ආණ්ඩුවේ සැඟවුණු න්‍යාය පත්‍රය තුළ රට තුළ ඒක පක්ෂ දේශපාලනයක් ස්ථාපිත කිරීමට දරන ප්‍රයත්නය විටින් විට හෙළිදරව් වී තිබේ.

ආණ්ඩුව විශාල මුදලක් වැය කරමින් ආරම්භ කළ ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය තුළද එය සැඟවී තිබුණි. පළාත් පාලන ආයතනවල සහ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවල බලතල ඉක්මවා යන දේශපාලන අධිකාරියේ ව්‍යුහයක් ලෙස යෝජනා කළ ප්‍රාදේශීය කමිටු සහ දිස්ත්‍රික් කමිටු යෝජනාව එවැන්නකි.

තමාට බලය හිමි නොවන පළාත් පාලන ආයතන වලට මූල්‍ය ප්‍රතිපාදන ලබා නොදෙන බවට කළ තර්ජනයද වක්‍රව ඉඟිකරනුයේ බහු පක්ෂ දේශපාලනයට ආණ්ඩුවේ ඇති නොකැමැත්තයි. මෑතදී යෞවන සමාජ පිහිටුවීමේදී ඇති වූ තත්ත්වයද විග්‍රහ කරන විට මෙය මනාව පැහැදිලි වේ.

බිම් මට්ටමේ දේශපාලනය භේදයකින් තොරව ක්‍රියාත්මක වන පොදු සමාජ සේවා සංගම්වල බලය ආණ්ඩුවේ දේශපාලනයට නතුකර ගැනීමට දරණ ප්‍රයත්නය තුළ ආණ්ඩුවේ අරමුණ වඩ වඩාත් පැහැදිලි වේ. මෙවැනි දේශපාලන වැඩපිළිවෙලක් තුළින් රාජ්‍ය පාලනය පක්ෂ දේශපාලනයට නතු කර ගැනීමේ ක්‍රියා පිළිවෙත අනුගමනය කරන අනුගමනය කළ ලෝකයේ නිදර්ශන අපට පෙන්වා දී ඇත්තේ ඒකාධිපති පාලනයක ස්වරූපය සහ ක්‍රියාකාරීත්වයයි.

එවැනි ඒකාධිපති වැඩපිළිවෙළක ප්‍රමුඛතම ලක්ෂණයක් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පක්ෂ නායකයින් සහ දේශපාලන පක්ෂ දේශපාලනයෙන් ඉවත් කිරීම සඳහා ආණ්ඩුව ඔවුන් වෙත මර්ධනයේ හස්තය දියත් කිරීමයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අත්අඩංගුවට ගැනීමේ සංවිධානාත්මක ක්‍රියාවලිය තුළ යටි පෙළ නිවැරදිව කියවා ගැනීම රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්මට අතිශය වැදගත් බව අවධාරණය කරමු.

ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී සියලුම ක්‍රියාවන්ට එරෙහිව කොන්දේසි විරහිතව සියලු දේශපාලන පක්ෂ සිවිල් සංවිධාන සමඟ කටයුතු කිරීමට සමගි ජන බලවේගය කටයුතු කරන බව අවධාරණය කරමු.

මේ තීරණාත්මක මොහොතේ අප සියලු දෙනා එකට එක්ව කටයුතු නොකළහොත් ඒකාධිපති ඒක පාක්ෂික අධිපතිවාදයක් රට තුළ ගොඩනැංවීම වැළැක්විය නොහැක.

සුප්‍රකට ජර්මන් කවියකු වූ මොලර් සඳහන් කලාක් මෙන් ඔබේ දොරට තට්ටු කරන විට කිසිවෙකු නොසිටි යන අවස්ථාවට එළඹෙන තෙක් නිහඬව නොසිටිමුයැයි සියලු ප්‍රජාතන්ත්‍රවාදීන්ට සමගි ජන බලවේගය ආයාචනා කර සිටී.

ස්තුතියි,
මෙයට- හිතවත්

**ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර (පා.ම.)**
මහලේකම්,
සමගි ජන බලවේගය.

ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර (පා.ම.)
මහ ලේකම්
සමගි ජන බලවේගය
අංක: 592, බංගලා හන්දිය, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ